# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,603 — 1958 නොවැම්බර් 28 වැනි සිකුරාද—28.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස : (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 2659 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් | 2672 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 2663 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 2664 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත් | — |
| තීරණය කල වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාගිරාදිය විකිණීම් ... ... | 2671 | විවිධ දැන්වීම් ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක්ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීහු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීන්ගේ කැමැත්ත පරිදි සිදු වේ.

2659—ජේ. ඇන්. බී 8988—6,199 (11/58).

**(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.**

**සංලක්ෂ්‍යය.—" නවප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද, එසේ ම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදිප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.**

**5. අවශ්‍ය සුදුසුකම්.—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.**

**6. යුද්ධසේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර 3 වැනි දිනත්. ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.**

**7. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ සථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද" යි සඳහන් කොට එවිය යුතු ය.**

**(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.**

**(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම්කුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.**

**(iv) යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.**

**(v) මේ දැන්වීමෙ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.**

---

## අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය

### පොත් බඳින්නකුගේ තනතුර

අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ පොත් බඳින්නකුගේ තනතුරක් සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත් භාර ගනු ලැබේ. අයදුම් පත්, 1958 දෙසැම්බර මස 20 වැනි දින දී හෝ ඊට කලින් හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් හට ලැබෙන ලෙස එවිය යුතුය.

2. **වැටුප.**—මේ තනතුරට නියමිත වැටුප් ක්‍රමය අවුරුද්දකට රුපියල් 750න් පටන් ගෙන, රුපියල් 42 බැගින් වූ වැඩිවීම් 13කින් රු. 1,296 තෙක් නගී.

3. **පත්වීම් පිළිබඳ කොන්දේසි.**—මේ තනතුර සථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරාගත් අයදුම්කරු තුන් වසක් ආධුනිකත්වයෙහි තබනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම—

(අ) 1958 දෙසැම්බර 20 වැනි දිනට තමාගේ වයස අවුරුදු 25ට නො අඩු බවට ද අවුරුදු 45ට නො වැඩි බවට ද,

(ආ) තමා විශිෂ්ට චරිතයකින් හා යහපත් සෞඛ්‍යයෙන් යුක්ත බවට ද,

(ඇ) තමා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මේ කවර මාධ්‍යයකින් හෝ යටත් පිරිසෙයින් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සාමාර්ථ්‍යය ලබා සිටින බවට හා පොත් බැඳීමේ කටයුතු ගැන මනා පළපුරුද්දක් තබාට තිබෙන බවට ද,

සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ආණ්ඩුවේ සේවකයන් හෝ අර්ධ ආණ්ඩුවේ සේවකයන් හෝ සම්බන්ධයෙන් යථොක්ත වයස් සීමා හා අධ්‍යාපන සුදුසුකම් බල නො පැවැත්වේ).

5. අයදුම්කරුවන් විසින්, මේ අයදුම්පත්වලට පහත සඳහන් සහතික (මුල් ලිපි නොව) පිටපත් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ ලබා ඇති උසස් ම සහතිකය,

(ඇ) තම චරිතය ද මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව ද සම්බන්ධයෙන් මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්,

(ඈ) පොත් බැඳීමේ වැඩ පිළිබඳ තමාගේ පළපුරුද්ද ගැන නියම බලධාරියකුගෙන් ලබා ඇති සහතිකය,

(ආණ්ඩුවේ සේවයෙහි හෝ අර්ධ ආණ්ඩුවේ සේවයෙහි හෝ දැනටමත් නියුක්ත අයදුම්කරුවන් විසින්, උප්පැන්න සහතිකවල ද, අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවලද, චරිත සහතිකවලද පිටපත් එවීම අවශ්‍ය නොවේ. ඔවුන්ගේ අයදුම්පත් ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය).

6. අයදුම් පත් ද ඒ පිළිබඳ අනෙක් ලියුම් කියුම් ද එවිය යුත්තේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. මේ ගැසට් පත්‍රයේ I වන කාණ්ඩයේ II වැනි ඡේදයේ මුල පළවෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

එස්. ආර්. විජයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 573, කොළඹ 12.
1958 නොවැම්බර මස 20 වැනි දින දීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ අභ්‍යාස විද්‍යාලයයන්හි නැටුම් ආචාර්ය තනතුර

රජයේ අභ්‍යාස විද්‍යාලයයන්හි නැටුම් ආචාර්ය තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර 1958.12.19 වැනි දින තෙක් කොම්පඤ්ඤ වීදියේ, මලයි වීදියේ අධ්‍යාපන කාර්යාලයේ ටී. සී. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් භාරගනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—තනතුරට නියමිත වැටුප් ක්‍රම පහත දැක්වේ :—

| | |
|---|---|
| (අ) ඉන්දියාවේ විශ්ව විද්‍යාලයයක හෝ පිළිගත් ආයතනයක ඩිප්ලෝමා උපාධිය හෝ, සහතික පත්‍රය හෝ, රජයේ ලලිත කලා ආයතනයේ 6 අවුරුදු නැටුම් අභ්‍යාස මාලාව, හෝ | වාර්ෂික වැටුප රු. 1,920—72 සහ 120—3,240— |
| (ආ) ගාන්ධර්ව සභාවේ අවසාන සහතික පත්‍රය හෝ, රජයේ ලලිත කලා ආයතනයේ මධ්‍යම සහතික පත්‍රය හෝ, ඩිප්ලෝමා උපාධියන් පිළිබඳ අන්‍ය කවර හෝ මධ්‍යම සහතික පත්‍රයක්. | වාර්ෂික වැටුප රු. 1,344—72 රු. 2,568. |
| (ඉ) අධ්‍යාපනික සුදුසුකම් රහිත වුවත්, නැටුම් පිළිබඳ මනා දැනුමක් ඇති හොඳින් නටන්නට පුළුවන් අය. | වාර්ෂික වැටුප රු. 918—42—රු. 1.564. |

3. **අධ්‍යාපන හා අනික් අවශ්‍ය සුදුසුකම් :—**

(i) ධුරාපෙක්ෂකයන් ඉන්දියාවේ විශ්ව විද්‍යාලයයක හෝ පිළිගත් ආයතනයක ඩිප්ලෝමා උපාධිය හෝ, සහතික පත්‍රය හෝ රජයේ ලලිත කලා ආයතනයේ 6 අවුරුදු නැටුම් අභ්‍යාස මාලාව හෝ, ගාන්ධර්ව සභාවේ අවසාන සහතික පත්‍රය

හෝ රජයේ ලලිත කලා ආයතනයේ මධ්‍යම සහතික පත්‍රය හෝ ඩිප්ලෝමා උපාධියක් පිළිබඳ අන්‍ය කවර හෝ මධ්‍යම සහතික පත්‍රයක් ලබා සිටින අය හෝ අධ්‍යාපන සුදුසුකම් රහිත වුවත්, නැටුම් පිළිබඳ මනා දැනුමක් ඇති හොඳින් නටන්නට පුළුවන් අය හෝ විය යුතුය.

(ii) 1958.12.19 වැනි දිනට ධුරාපේක්ෂකයන්ගේ වයස අවුරුදු 22 ට අඩු හෝ අවුරුදු 45 ට වැඩි හෝ නො විය යුතු ය. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් ඉහළ වයස් සීමාව නො යෙදේ.

(iii) තෝරා ගනු ලබන ධුරාපේක්ෂකයා 3 අවුරුදු ප්‍රවාසන කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

4. **විශේෂ කොන්දේසි.—**

(i) තෝරා ගනු ලබන ධුරාපේක්ෂකයා පළමුවරට උයන්වත්ත අභ්‍යාස විද්‍යාලයයට පත් කරනු ලැබේ. එහෙත් ස්ථාන මාරු කොට යැවීමට යටත් ය.

(ii) ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ නියමිත ෆෝරමයෙහි ය. එහි ආදර්ශයක් මෙහි පහත දී ඇත. මේ කාර්යාලයෙන් ෆෝරම සපයනු නො ලැබේ. දැන්වීමේ දී තිබෙන ආදර්ශයෙන් ධුරාපේක්ෂකයන් විසින් ෆෝරමය පිටපත් කර ගත යුතුය. ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ දැනට ඔබේ සේව්‍යයා මගිනි.

(iii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මේ තනතුර විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ තනතුරක් දරන ගුරුවරයකු පත් කරනු ලැබුවහොත්, ඔහු මේ තනතුර දරන තුරු මේ තනතුර විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කරනු ලැබේ.

(iv) ඉහත සඳහන් (2) ඉ ඡේදයෙහි සඳහන් වූ වැටුප් ක්‍රමයට පත් කිරීම සඳහා ධුරාපේක්ෂකයකු තෝරා ගතහොත්, තනතුර විශ්‍රාම වැටුප් රහිත ය. එබඳු ධුරාපේක්ෂකයකු විසින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට සවකීය වැටුපෙන් සියේට 5 ක් ගෙවීමෙන් දායක වීම අවශ්‍ය ය.

5. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදය පටන් ගැන්මේ පළ කර තිබෙන, රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසිද බලනු මැනැව.

ඊ. එච්. ද අල්විස්,
අ. අ. වෙනුවට.

අංකය : ඊ. සී. සී. 2726.
1558 නොවැම්බර් මස 28 වැනි දින
අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
කොළඹ 2.

### ආදර්ශ ෆෝරමය

**උයන්වත්තේ රජයේ අභ්‍යාස විද්‍යාලයේ නැටුම් ආචාර්ය තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) තැපැල් ලිපිනය : ————.

(3) 58.12.19 වැනි දිනට නිවැරිදි වයස—

අවුරුදු :——. මාස :——. දවස් :——.

(4) ජාතිය හා එය ලබාගත් අන්දම : ————.

(5) උපන් ස්ථානය—

(අ) ඉල්ලුම්කරු : ————.

(ආ) ඔහුගේ පියා : ————.

(ඉ) ඔහුගේ පියාගේ පියා :————.

(ඊ) ඔහුගේ පියාගේත් පියා :————.

(6) ශාස්ත්‍රීය සහතික පත්‍ර, ඒවා ලබාගත් දින සමග (ලබාගත් උසස්ම ශාස්ත්‍රීය සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුයි) : ————.

(7) වෘත්තීය සුදුසුකම් :————.

(8) ඉගෙනීම ලැබූ විද්‍යාල හා පාඨශාලා (ඇතුළත් වූ හා අස්වූ දින සඳහන් කළ යුතුයි) :————.

(9) ඉගැන්වීමේ පලපුරුද්ද (මෙහි පහත දක්වා තිබෙන ෆෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :—

| විද්‍යාලයේ හෝ පාඨශාලාවේ නම | බැඳුනු දිනය | අස්වූ දිනය | දැරූ තනතුර | සේවා කාලය අ. මා. ද. | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |

මුළු කාලය :————.

(10) සිංහලෙන් සුදුසුකම් :————.

(11) කල් ක්‍රියාව පිළිබඳ සහතික පත්‍ර ලබා ගත් අයගේ (ඥාතීන් නොව) නම් හා පදවි නාම :————.

(චරිත සහතික තුනක පිටපත් ඇමිණිය යුතුය. මුල් පිටපත් ඇමිණිය යුතු නොවේ. රජයේ සේවයේ නියුක්ත අයගෙන් චරිත සහතික අනවශ්‍යය.)

(12) අනික් විස්තර :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා එයින් ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තේරීමෙන් පසු ඒ බව දැන ගන්නට ලැබුණොත්, කිසිම වන්දියක් රහිතව මා රාජකාරියෙන් පහ කර දැමීමට යටත් වන බවද මම දනිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

## II වෙනි හා III වෙනි පෙළේ සමුපකාර පරීක්ෂකවරු ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ සේවයට තාවකාලිකව පත් කිරීම

පහත සඳහන් කොන්දේසි යටතේ, ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ සේවය සඳහා ඉල්ලුම් පත්‍ර සමුපකාර පරීක්ෂකවරුන්ගෙන් ආරාධනා කරනු ලැබේ :—

(1) **තාවකාලිකව සේවයට පත් කිරීමේ කාලය.**—තාවකාලිකව සේවයට පත් කිරීමේ කාලය සාමාන්‍යයෙන් අවුරුදු 2කි.

(2) **වැටුප්.**—මණ්ඩලය යටතේ සේවයට තාවකාලිකව පත් කරනු ලබන රජයේ නිලධාරියකුට ගෙවිය හැකි වැටුප්, මණ්ඩලයේ ඒ සේවයට නියමිත වැටුප් ප්‍රමාණයෙහි ඒ නිසි ස්ථානයට හිමි වන මුදල වන්නේ ය. එහෙත්, එය, ආණ්ඩුව යටතේ ඔහු ගේ වැටුපෙන් සියයට 150ට වැඩි නොවිය හැකිය. රජයේ නිලධාරීන්ට හා සමාන ගෙවල් කුලී හා ජීවනාධාර මුදල්ද ගෙවනු ලැබේ.

(3) **ගෙවල් කුලී.**—මේ නිලධාරීන්ට, ගල්ඔය නිම්නයෙහි නිවාස සපයා දෙනු ලැබේ. සථිර නිවාසයක පදිංචි වන නිලධාරියකුට ගෙවල් කුලී නොගෙවනු ලැබේ. ඒ අතරම, ඔහුගේ වැටුපෙන් සියයට 3ක් ගෙවල් කුලී වශයෙන් අය කර ගනු ලැබේ. තාවකාලික නිවාසයක පදිංචි වන නිලධාරියකුට ගෙවල් කුලී නොගෙවනු ලැබේ. නමුත් ඔහුගේ වැටුපෙන් කිසිවක් ගෙවල් කුලී වශයෙන් අය කර ගනු නොලැබේ.

(4) **නිවාඩු.**—රජයේ නිලධාරීන්ට හා සමානය.

(5) **නිවාඩු බලපත්‍ර.**—රජයේ නිලධාරීන්ට හා සමානය.

(6) **මොටෝ රථ මිලයට ගැනීමට අත්තිකාරම් මුදල්.**—රජයේ නිලධාරීන්ට හා සමානය.

(7) **වෛද්‍ය පහසුකම්.**—මණ්ඩලයේ සේවකයන්ගේ වෛද්‍ය ක්‍රමයට ඇතුල්වීමට මේ නිලධාරීන්ට පුළුවන. එසේ ඇතුල්වන සෑම නිලධාරියෙක්ම, නියමිත පරිදි, මාස්පතා රු. 5ක් හෝ 10ක් හෝ ඒ ක්‍රමය වෙනුවෙන් ගෙවිය යුතු වේ. මණ්ඩලයද, ඒ හා සමාන මුදලක් ඔහු වෙනුවෙන් ඒ සඳහා ගෙවනු ලැබේ. නිලධාරියකුටද, ඔහුගේ පවුලේ අනිකුත් අයටද අවශ්‍යවන වෛද්‍ය වියදම් ඒ අර මුදලෙන් ඔහුට හිමි මුදල්වලින් ගෙවනු ලැබේ.

ඉල්ලුම් පත්‍ර 1958 දෙසැම්බර් 10 වෙනි දින හෝ ඊට පෙර මට ලැබිය යුතුය. ඒවා ඒ ඒ කොට්ඨාශයේ උප කොමසාරිස් තුමාගේ මාර්ගයෙන් එවිය යුතුය.

වී. ඩී. ඇල්. පීරිස්,
ස. ස. කො. වෙනුවට.

සමුපකාර දෙපාර්තමේන්තුව,
කොළඹ, 1958.11.22.

අංකය : ඊ./එස්. (2)—129.

## කොළඹ වරාය කොමිෂන් සභාව

### සහකාර මිනින්දෝරු ආධුනිකයන්ගේ තනතුරු

වරාය කොමිෂන් සභාවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ අංශයෙහි සහකාර මිනින්දෝරු ආධුනිකයන්ගේ තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව තැනුණු අයදුම් පත් 1958 දෙසැම්බර් මස 13 වන දිනට ප්‍රථම වරාය කොමසාරිස්තුමාට ලැබිය යුතුයි.

**2. වැටුප් ක්‍රමය.**—

(1) ආධුනික කාලය තුළ ආධුනිකයන් හට ගෙවනු ලබන දෛනික වැටුප රු. 2.80 වේ.

(2) ආධුනික කාලය ඇවෑමෙන් පවත්වනු ලබන න්‍යායානුකූල හා ප්‍රායෝගික වැඩ පිළිබඳ පරීක්ෂණයකින් සමත් වුවහොත් සහකාර මිනින්දෝරු තනතුරු වලට පත්වීම් ලැබීමට සුදුසු කම් ඇත්තෝ වෙති. එකී තනතුරු වල වැටුප් ක්‍රමය රු. 1,620—120—3,780 හෝ එවකට නියම කරනු ලබන වැටුප් ක්‍රමයක් වේ.

**3. සුදුසුකම්.**—සෑම අයදුම් කරුවෙකුම සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුත්තේ—

(1) වයස අවුරුදු 17ට නොඅඩු හා අවුරුදු 22ට නොවැඩි බවට.

(2) හොඳ චරිතයක් හා ශාරීරිකව සතුටුදායක බවට.

(3) ගණිතය සමඟ ජ්‍යෙෂ්ඨ සමත් වී තිබෙන බව.

(4) බිම් මැනීම හා මට්ටම් කිරීම පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලය විසින් සම්පූර්ණ දවල් කාලය තුළ පවත් වනු ලබන පාඨ මාලාව සාර්තක ලෙස නිමාකර, නියමිත පරීක්ෂණයකින් සමත් වී තිබෙන බවද වේ.

**4. පුහුණුව පිළිබඳ වැඩ පිළිවෙල.**—කොළඹ වරාය තුළ හා ඊට අදාල තන්හි සෑම අංශයකම, ජලමානයත් ඇතුලුව, මැනීම හා මට්ටම් කිරීම පිළිබඳ පුහුණුවක් මෙම දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරයා යටතේ ලැබෙනවා ඇත. පුහුණුවීමේ කාලය අවුරුද්දකි. යම් ආධුනික යෙකුගේ ප්‍රගතිය අසතුටුදායක නම් ආධුනික කාලය දිගු කිරීමට හෝ සම්පූර්ණයෙන්ම නැවැත්වීමට හෝ ප්‍රධාන ඉංජිනේරු තැනට බලය තිබේ.

**5. සේවා කොන්දේසි, ආදිය.**—

(1) ආධුනිකයන්ට බලපාන සියලුම දෙපාර්තමේන්තු නීති රීති වලට යටත් විය යුතුයි.

(2) නිවාඩු හා වෙනත් වරප්‍රසාද සෙසු ආධුනිකයන් හට නියමිත ඒවාමෙනි.

(3) නොසැලකිලිමත් කමින් ආදිය දෙපාර්තමේන්තුවේ දේපල වලට අලාභ හානි සිදු වුවහොත් ආධුනිකයන් වන්දි ගෙවිය යුතුයි.

6. අයදුම්කරුවන් සම්පූර්ණ හා නිවැරදි විස්තර අයදුම් පතෙහි ඇතුලත් කළ යුතුයි. චරිතය හා පත්වීම ලැබීමට සුදුසුකම් පිළිබඳව මෑතදී ලබාගත් සහතික තුනක පිටපත් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතුයි.

7. මෙම නිවේදනයෙහි අන්තර්ගත සියලුම අවශ්‍යතාවයන්ට අනු කූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

8. රාජ්‍ය සේවා තනතුරු වලට පත්වීම් සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයෙහි I වෙනි කොටසේ II වෙනි ඡේදයේ මුල දැක්වෙන සාමාන්‍ය කොන්දේසි අයදුම්කරුවන්ගේ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

ඊ. සී. ද අල්විස්,
වරාය කොමසාරිස්තුමා වෙනුවට.

වරාය කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 1, 1958 නොවැම්බර් මස 19 වන දින.

### ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.
(ලාංකිකයෙක්ද යන බව)

4. උපන් දිනය හා වයස :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුයි)

5. අධ්‍යාපනික සුදුසුකම් :————.
(ගණිතයත් සමඟ ජ්‍යෙෂ්ඨ සමත් වී තිබේද ?)

6. වෘත්තීය සුදුසුකම් :————.
(නිවේදනයේ 3 (4) වැනි ඡේදය යටතේ නියමිත සුදුසුකම් තිබේද ?)

7. පුහුණුව හා පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

8. සහතික ඉදිරිපත් කරන අයගේ නම් හා තරාතිරම :————.

9. වෙනත් විස්තර ඇත්නම් :————.

ඉහත සඳහන් විස්තර සැබෑ හා නිවැරදි බව සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන :————.

---

## ධීවර දෙපාර්තමේන්තුව

### සහකාර මැකනික් (තාවකාලික) තනතුර

කොළඹ, ගාලු මුවදොර, ධීවර දෙපාර්තමේන්තුවේ සහකාර මැකනික් (තාවකාලික) තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත පෙනෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගත් ඉල්ලුම් පත්‍ර 1958 දෙසැම්බර් 20 වැනිදා හෝ ඊට පෙර මට ලැබෙන්නට සැලැස්විය යුතුයි.

**2. වැටුප්.**—දෛනික වැටුප රුපියල් 2.30න් පටන්ගෙන වාර්ෂික වැඩිවීම ශත 12 බැගින් රුපියල් 3.74 දක්වා නගී.

**3. සේවා කොන්දේසි.**—මේ තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. ඔහුගේ සේවය වැඩිපුර කළ යුත්තේ කොළඹ වුවද, මොහොතක දැනුම් දීමක් පිට ලංකාවේ ඕනෑම තැනකට අළුත්වැඩියා කිරීම සම්බන්ධ කටයුත්තකදී යාමට නියෝග කළහොත්, තෝරාගනු ලබන නිලධාරියා එසේ කළ යුතුයි.

(ii) තෝරා ගනු ලබන නිලධාරියා ඉතා කෙටි දැනුම්දීමකින් පසුව තනතුරේ වැඩ බාර ගැනීමට සූදානම් විය යුතුයි.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයාම පිටර් කෙනකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 10ක පළපුරුද්දක් ලබා තිබිය යුතුයි. ඔහුට ඩීසල් සහ පැට්‍රෝල් එන්ජින් අළුත්වැඩියා කිරීමත්, යන්ත්‍රවල සහ මෝලෙහි (ප්ලාන්ට්) සාමාන්‍ය පිළියම් (රිපෙයාර්) වැඩ කිරීමටත් පුළුවන්කම තිබිය යුතුයි.

ඉංග්‍රීසි කණිෂ්ඨ පන්තිය හෝ ඊට සමාන සහතිකයක් ඇති අයට විශේෂයෙන් සළකනු ලැබේ.

අපේක්ෂකයා වයස අවුරුදු 30 ට අඩු නොවූත් අවුරුදු 40 ට වැඩි නොවූත් අයකු විය යුතුයි.

5. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරියකු විසින් එවනු ලැබ, නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පතක් වෙතොත්, එය භාරගනු ලබන්නේ, එම ඉල්ලුම් පත්‍ර නියමිත දිනට කලින් ඉල්ලුම්කරුගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ලැබුන බව සඳහන් කොට, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි හේතු දක්වා, එය භාර ගන්නා ලෙස එම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ කරතොත් පමණකි.

6. හැම අයදුම්කරුවකුම විසින් පහත සඳහන් කර ඇති සහතික පත්‍රවල පිටපත් (මුල් සහතික නොවේ) එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය ;

(ii) 4 වැනි ඡේදයේ පෙන්වා දී ඇති අධ්‍යානික සුදුසුකම් පිළිබඳ සහතික ;

(iii) චරිතය පිළිබඳ ළඟදී ලබාගත් සහතික පත්‍ර දෙකක්.

**සැළකිය යුතුයි.**—මේ පිටපත් ආපසු එවනු නොලැබේ.

7. ඉල්ලුම් පත්‍ර හා ඒ පිළිබඳ සෙසු ලියකියවිලි එවිය යුත්තේ ධීවර අධිකාරී තැනට මිස පෞද්ගලික ලිපිනයට නොවේ. මේ ගැසට් නිවේදනයේ සඳහන් සියලුම අවශ්‍යතාවන්ට යම් ඉල්ලුම් පත්‍රයක් එකඟ නොවේ නම්, එවැනි ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ පෙන්වා ඇති රාජ්‍ය සේවා තනතුරුවල පත් කිරීම් කෙරෙහි බල පවත්වන පොදු කොන්දේසි ද කියවා බලන්න.

ඩී. ටී. ඊ. ඒ. ද පොන්සේකා,
ධීවර අධිකාරී.

ධීවරඅධිකාරිය,
තැපැල් පෙට්ටිය 531,
ගාලු මුවදොර, කොළඹ.

## ඉල්ලුම් පත්‍රය

### ධීවර දෙපාර්තමේන්තුව

**සහකාර මැකනික් (තාවකාලික) තනතුර**

1. සම්පූර්ණ නම :———,
   (අ) වාසගම :———.
   (ආ) අනික් නම් :———.
2. ලිපිනය :———.
3. (අ) 1958 —— වැනිදාට නියම වයස : අවුරුදු ——, මාස ——, දින ——.
   (ආ) උපන් දිනය :———.
   (උප්පැන්න සහතිකයේ පිටපත් අමුනා එවිය යුතුයි.)
4. උපන් ස්ථානය :
   (අ) ඉල්ලුම්කරු :———.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :———.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :———.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ සීයා :———.
5. ජාතිය :———.
   (i) පාරම්පරිකද ? :———.
   (ii) ලියාපදිංචි වීමෙන්ද ?
6. ඉල්ලුම්කරු විවාහකද. අවිවාහකද, බිරිඳ මැරීගොස්ද ? ———.
7. අධ්‍යාපනික ඉතිහාසය, පාඨශාලාවලට බැඳුනු හා අස්වූ දින, පෙනී සිටි ප්‍රසිඛ විභාගවල දින සහ අන්තිමට සමත්වූ ප්‍රසිඛ විභාගයේදී ගත් විෂයයන් :———.
8. පාඨශාලාවෙන් අස්වූ පසු කරන ලද රැකිරක්ෂා දින සහිතව විස්තර කරන්න :———.
9. කාර්මික හා වෘත්තිය සුදුසුකම්, විභාගවල දින සහ සම්පූර්ණ කළ පුහුණුව :———.
10. ක්‍රීඩා කටයුතු පිළිබඳ තොරතුරු :———.
11. ඉංග්‍රිසි සහ සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම හා තේරුම් කරදීම පිළිබඳ දැනුම :———.
12. දැනට කරන රක්ෂාව හා වැටුප :———.
13. ඉල්ලුම්කරු පිළිබඳ තොරතුරු ලබාගත හැකි. ඔහු හොඳින් දන්නා දෙදෙනකුගේ නම් හා ලිපිනයන්, (මේ අයගෙන් සහතික නොලබා තිබිය යුතුයි) :———.
14. මේ තනතුරු සඳහා ඇති විශේෂ සුදුසුකම්, එනම් ඉල්ලනු ලබන තනතුරේ කටයුතු හා සමාන කටයුතුවල පළපුරුද්ද :———.
15. යුධ හමුදාවේ සේවය කර තිබේනම් ඒ පිළිබඳ විස්තර : ———.
16. තවත් තොරතුරු :———.

මේ ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් දී ඇති තොරතුරු සත්‍ය නිවැරදි බවට සහතික කරමි. මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තනතුරට තෝරා ගැනීමට පළමුවෙන් සොයා ගතහොත් මා තනතුරට නුසුදුස්සෙකු වන බවත්, පත්කළාට පසුව සොයා ගතහොත් කිසිම වන්දියක් නොදී තනතුරෙන් පහකරනු ලබන බවත් මම දනිමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

ධීවර අධිකාරී වෙතටය,
ගාලු මුවදොර,
තැපැල් පෙට්ටිය 351,
කොළඹ.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**1958 පෙබරවාරි මාසයේදී පවත්වනු ලැබූ මධ්‍ය ලිපිකාර විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයන් තැපැල් ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකරු පඩක්තියට පත්කිරීමට තෝරා ගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

| නම | | ලිපිනය |
|---|---|---|
| අබේසිරි, එච්. ඩබ්ලිව්. | ... | ගලපාත, වඩුමුල්ල, බෙන්තොට. |
| අමරසේන, ජී. එච්. | ... | බෝධිගුප්ත පිරිවෙන, දෙනගමුව, පොල්ගහවෙල. |
| ආරියදාස, ඇම්. ජී. | ... | කුරුඳුවත්ත, පොද්දල. |
| ආරියරත්න, ඇස්. ඇම්. | ... | මොරහැලකන්ද, වැල්ලව, පොල්ගහවෙල. |
| ආරියවංශ, කේ. ටී. | ... | ගුලුගහ පාර, ගෝනාපීනුවල. |
| උපදාස, අයි. ටී. ජී. | ... | හල්ඔලුව, පල්ලේගම, හල්ඔලුව. |
| උබයසේන, එච්. කේ. | ... | බේරුවාවල, හක්මන. |
| කන්දසාමි, කේ. | ... | තනන්කිලප්පු, චාවාකච්චේරිය. |
| කපුරුබංඩා, ඩබ්ලිව්. ඇම්. | | කේ. රත්හාමි බාරේ, වැගෙදර, ගල්ගමුව. |
| කාරියප්පෙරුම, කේ. ඒ. ඞී. පී. | | මාබිම, හෙයියන්තුඩුව, කැළණිය. |
| කුලදාස, එච්. කේ. ඒ. | ... | පරගහළඟ, කැකනදුර, මාතර. |
| ගුණතිලක, වයි. ඇම්. | ... | මොරුප්පුලිය, දන්කොටුව. |
| ගුණසේකර, ඇල්. ජේ. | ... | ගල්බොඩ, වතුරුගම (බ. ප.) |
| ජයකොඩි, ජේ. ඒ. ඊ. | ... | අංක 3, යක්කල පාර, ගම්පහ. |
| ජෝතිරත්න, ඞී. ඩබ්ලිව්. | | සීනිගම, හික්කඩුව. |
| තිලකසිරි, පී | ... | 194, පන්සල පාර, කොළඹ 10. |
| ධනපාල, ජී. එච්. | ... | සෙන්ට්‍රල් බේකරිය, කොස්ලන්ද. |
| ධම්දස, ඇන්. වී. | ... | තෙලඹුගහවත්ත, අඳුගොඩ, දික්කුඹුර, අහංගම. |
| ධර්මදාස, ඩබ්ලිව්. කේ. | ... | හේනෙකඩේ, කිරිමැටිමුල්ල, තෙලිජ්ජවිල. |
| පලිහවඩන, ඇල්. | ... | "ජයසිරි නිවස", වැලිහේන, අකුරැස්ස. |
| පින්හාමි, ටී. | ... | ඒ/ඇටබගස්කඩ, අලවීරගොල්ලාව. |
| පියතිස්ස, ඇස්. වී. ඒ. | ... | 10 වෙනි සැතපුම් කනුව ළඟ, පුහුල්වැල්ල, යටියන. |
| පියදාස, කේ. ජී. | ... | කම්මල්ගොඩ, ගෝනාපීනුවල. |
| පියසේන, ඇස්. ඇම්. | ... | කුරුකුඩ, ආණ්ඩුවේ පාසල, පට්ටියගෙදර. |
| පියසේන, ඇම්. පී. | ... | පල්ලේගම, දෙණියාය. |
| පුංචිබණ්ඩා, ටී. ඇම්. | ... | අලුදෙණිය, රඹුක්කන. |
| පෙරේරා, කේ. ඞී. පී. | ... | "ප්‍රේමසිරි", කුඹුක බටහිර, ගෝනපොල. |
| ප්‍රේමදාස, කේ. ආර්. | ... | වේල්ල පාර, කොස්ගහදූව වත්ත, ගෝනාපීනුවල. |
| රුද්‍රිගු, කේ. ඞී. ඇස්. | ... | මාපිටිය, දියලගොඩ, මග්ගොන. |
| රුද්‍රිගු, ඇම්. ජී. ඇන්. | ... | කුඹුක බටහිර, ගෝනපොල. |
| වික්‍රමසිංහ, ඒ. කේ. | ... | බීඩී/හිල්ඔය කණිෂ්ඨ පාසල, බණ්ඩාරවෙල. |
| විනායගමූර්ති, ඇස්. | ... | වෙම්බෝදි මාවත, තුනාලෙයි දකුණ, කරවෙඩ්ඩි. |
| වින්සන්ට්, ඩබ්ලිව්. කේ. ඒ. | | හොරනැපොල, වැලිපැන්නගහමුල්ල. |
| විමලසිරි, ඇම්. යු. | ... | ගෝනමුල්ල, යක්කල. |
| වීරරත්න, ඇන්. ඞී. ඞී. | ... | මාලෙගොඩ, පයියාගල. |
| විරසිංහ, ඩබ්ලිව්. ඇල්. | ... | 271, පල්ලෙමුල්ල, හල්ඔලුව. |
| වීරසේන, එච්. ඇම්. පී. | ... | කටුගම්පොලගෙදර, වටරැක, මාවතගම. |
| සමරනායක, ආර්. ඇම්. ඞී. ඇල්. | | සමනබැද්ද, තිත්තපත්තර. |
| සල්ගාදු, ඇස්. ජී. ආර්. | | වැලිපෝන් කායශාලය, ගල්කිස්ස. |
| සිරිසේන, ඇම්. | ... | හල්තොට වත්ත, අවිස්සාවේල්ල. |
| සුගතදාස, ඒ. පී. | ... | 42, කඩ වීදිය, ගම්පහ. |

| නම | | ලිපිනය |
|---|---|---|
| සුමනතිලක, ඇස්. ආර්. | ... | මල්වානෙගෙදර, මූණමල්දෙණිය. |
| සේපාල, ඒ. | ... | හල්කඳවිල, පයියාගල. |
| සෝමතිලක, ඇල්. | ... | දොරබාවිල, තුත්තිරිපිටිගම, කුරුණෑගල. |
| සෝමදාස, ඩබ්ලිව්. ඇම්. | ... | නාබිතිත්තාවැව, නිකදළුපොත. |
| සෝමපාල, ඒ. ඇල්. | ... | " හිත්තැටිය වත්ත", කිරින්ද, පුහුල්වැල්ල. |
| සෝමවීර, බී. ඒ. | ... | ශ්‍රී/මිල්ලෑව බෞද්ධ මිශ්‍ර පාසල, මොරවක. |
| හෙන්ද්‍රික්, පී. ඇල්. | ... | ශ්‍රී පියරත්න මාවත, කොකාවල, කැකනදුර. |
| හේමසිරි, ඊ. කේ. | ... | තල්ගම්පොල, ගාල්ල. |

2. මේ අපේක්ෂකයන්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව භාර නොගනියි. එහෙත් පුරප්පාඩු ඇතිවන විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සියලුම පත්වීම් තුන් අවුරුදු කාලයක ආධුනික තත්ත්වයේ වන අතර, මෙම සේවයේ කොන්දේසිවලට යටත් වෙනවා ඇත.

3. මේ අපේක්ෂකයන්ට පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් ලියා දන්වනු ලැබේ.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1958 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)

ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන් විසින්, 1959 ජනවාරි 27 වැනි දින පෙරවරු 9.30 දක්වා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට මාන ලියවන පට්ටලයක් (Gauge Lathe) ටැන්ඩර් අංක 192. සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ, පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටැන්ඩර් ෆෝරම ලබා ගත හැක. ටැන්ඩර් ෆෝරම ලබා ගැනීමට පෙර ටැන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන, පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1958 නොවැම්බර් 22 වෙනි දින,
කොළඹ.

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) ඇලුමිනියම් අඩු කෝප්ප සහ පිඟන් සැපයීම සඳහා 1958 දෙසැම්බර් 16 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1958 දෙසැම්බර් 15 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

යූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1958 නොවැම්බර් 28 වැනිදා,
කොළඹ දීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කන්තලේ උක් වගාවෙහි උක් පැළ සිටුවා ඇති හීවිටිවලට පස් පිරවීම

කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1958 දෙසැම්බර් මස 19 වෙනි දින පස්වරු 2.30 දක්වා කන්තලේ උක් වගාවෙහි අක්කර 1,600ක උක් පැළ සිටුවා ඇති හීවිටිවලට පහත සඳහන් අයුරු පස් පිරවීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

උක් පැළ සිටුවා ඇති හීවිටට එහි දෙපැත්තේ ඇති නියරවල් දෙකෙන් හාරා ගත් පස්වලින් උක් පැළය මුලට අඟල් 8වේ සිට 10 දක්වා වැසී යන සේ පස් දැමිය යුතුය. එසේ කිරීමෙන් පසු උක් පැළ සිටුවා ඇති හීවිට උස්වී කලින් උක් පෙර අතරේ තිබූ නියර ඉවත් වී එහි හීවිටක ආකාර කාණුවක් සෑදී තිබිය යුතුය. එවිට උක් සිටුවා ඇති පෙරය ගොඩවී නියරක් සෑදෙනවා ඇත.

ලබන ජනවාරි මාසයේ දී වැඩය ආරම්භ කර එතැන් සිට සති 6ක් ඇතුළත අවසන් කළ යුතුය.

2. කන්තලේ ප්‍රාදේශීය කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරී තැන ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ෆෝර්ම කොළ ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා පාවිච්චි කළ යුතුය. ටෙන්ඩර් පත්‍රය පිටපත් දෙකකින් යුක්ත විය යුතුවාත් හැර එය අත්සන් තබා ලියුම් කවරයක බහා සීල් තබා "කන්තලේ උක් වගාවෙහි පස් පිරවීම සඳහා ටෙන්ඩර්" යන්න එම ලියුම් කවරයෙහි වම් පැත්තේ මුදුනේ ලියා කොළඹ යූනියන් පෙදෙස් කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත යැවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමේ මුදල වන රු. 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබා ගත හැක. එක් එක් ටෙන්ඩර් පත්‍රය සඳහා තැන්පත් මුදල වන රු. 25ක් කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයෙහි හෝ තැන්පත් කළ යුතුය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය භාර ගත් බැව් දන්වා දින 10ක් තුළදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරන අතර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයටද ඇතුළත් කරනවා ඇත. එසේ කිරීමේදී එම ටෙන්ඩර් කරු නිසා ඇති වන රජයේ අන්‍ය හිමිකම් වලට අවාසියක් නොවනු ඇත.

4. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර තැන්පත් කරන පෙට්ටියේ තැන්පත් කළ හැකිය. නොඑසේ නම් රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම් ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය ලත් නිලධාරි තැන වන කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැන වෙත ටෙන්ඩර් පත්‍ර තමන්ම භාර දිය යුතුය. එසේ කරන ලද ටෙන්ඩර් පත්‍රද ලියුම් කවරයක බහා සීල් තබා "කන්තලේ උක් වගාවෙහි පස් පිරවීම සඳහා ටෙන්ඩර්" යන්න හා ටෙන්ඩර් කරුගේ ලිපිනයද එම ලියුම් කවරයෙහි සඳහන් කර තිබිය යුතුය.

5. රෙජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව ඒවා විවෘත කරන දින ටෙන්ඩර් කරුවන්ට තැපැලෙන් දන්වා යවනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුන හොත් එම ටෙන්ඩර්කරු වහාම ඒ බව කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත දැනුම් දිය යුතුය. ටෙන්ඩර් කරුගේ ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ එම ස්ථානයේ සිටීමට කැමති ටෙන්ඩර් කරුවන්ට එසේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වීමට නියමිත වේලාවේදී කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය නම් තමන් විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රයේ පිටපත සෝදිසි කර බැලීමට ඉඩ දෙනු ලැබේ. එසේ කිරීමට කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග පිළියෙල කර ගත යුතුය.

7. නියමිත ෆෝර්මයේ නොමැතිව හා ටෙන්ඩර් සඳහා අවශ්‍ය කොන්දේසි සම්පූර්ණව නොමැතිව ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතු අතර ඒවායේ යම් වෙනසක් කළ හොත් එහි ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යෙදිය යුතුය. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කර තිබෙන ගණන් අකුරෙන් හා ඉලක්කමෙන් සඳහන් කර තිබිය යුතුය.

16. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරණ සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන සථිර ඒවා වියයුතුයි.

17. වැඩි විස්තර නිකවැරටියේ සත්ව පාලන ගොවිපල භාර කළමනාකාරතැනගෙන් ලබාගත හැක.

ඇම්. ඇෆ්ජ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1958 නොවැම්බර් මස 17 වෙනි දින,
පේරාදෙණියේදීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරි මාර්ග ඉංජිනේරු තැන විසින් 1958 දෙසැම්බර් මස 12 වෙනි දින දහවල් 12 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ ලද්දුව වරාපිටිය කරදිය වැලක් වීමේ ව්‍යාපාරය වැඩි දියුණු කිරීමේ වැඩ සඳහා රු. 45,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් සීල් තබනලද ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කළුතර උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි තැන විසින් 1958 දෙසැම්බර් මස 1 වෙනි දින සිට 9 වෙනි දින දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. ටැන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී රු. 50ක ටැන්ඩර් තැන්පත් මුදලක් කළුතර කච්චේරියේ හෝ කළුතර වාරි මාර්ග කාර්‍යාලයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර කළුතර උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි තැනගෙන් විමසන්න.

ඊ. රණසිංහ,
කළුතර උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි තැන.

වාරි මාර්ග කාර්‍යාලය,
කළුතර, 19.11.58.

---

මහනුවර කොට්ඨාශ භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1958 දෙසැම්බර් මස 10 වෙනි බදාදා පෙරවරු 10 දක්වා පහත සඳහන් වැඩ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000ට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

'මිනිපේ, මොරයායේ ඕවර්සියර් නිවාසයක් තැනීම'

2. පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා මිනිපේ, වාර්මාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගෙන ඉදිරිපත් කළයුතුය. මේ සම්බන්ධ සියළු විස්තර සහිත කරුණු එම කාර්‍යාලයෙන් ලබාගත හැක.

3. දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ භාරව ක්‍රියා කරන අය විසින් එම වැඩවල ප්‍රමාණය ගැනද, ඒවා සතුටුදායක අන්දමින් කරගෙන යන බවද ඒ ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් සහතික ලබාගෙන ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

4. මිනිපේ වාරිමාර්ග කාර්‍යාලයේ හෝ කච්චේරියක මේ සඳහා රු. 25ක මුදලක් තැන්පත් කොට ලබාගත් රිසිට් ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 27.11.58 දින සිට 5.12.58 දින දක්වා ඇති රාජකාරියට නියමිත දවස් සහ වේලාවන් ශිදී මිනිපේ වාරිමාර්ග කාර්‍යාලයෙන් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

පී. වී. ධම්පාල,
මිනිපේ වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්‍යාලය,
මිනිපේ, 19.11.58.

---

කොළඹ කොටාරෝඩ්හි බටහිර කොට්ඨාශය භාර ඉංජිනේරුතුමා විසින් හුලංදූ ඔය ව්‍යාපාරයේ සංචාරක බංගලාවක් සෑදීම සඳහා 1958 දෙසැම්බර් මස 9 වැනි දින පෙරවරු 11.30 දක්වා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000 හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

හුලංදූ ඔය ව්‍යාපාරය භාර ඉංජිනේරු තැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝර්මවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් දෙක බැගින් එවිය යුතුය.

1958 දෙසැම්බර් 1 වැනි ද සිට 5 ද දක්වා (දෙදිනම ඇතුළුව) ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම සඳහා කච්චේරියක හෝ ඇඹිලිපිටියේ වාරිමාර්ග කාර්‍යාලයේ රුපියල් 50ක් තැන්පත් කොට ලබාගත් රිසිට් පතද, ලියාපදිංචි කරන ලද පොතද ඉදිරිපත් කළ යුතුයි. දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය එම වැඩ හෝ වැඩය භාර නිලධාරීන්ගෙන් එම වැඩ සතුටුදායක ලෙස කරගෙන යන බවට සහ දැනට තිබෙන වැඩ ප්‍රමාණය ගැනද සහතික ඉදිරිපත් කළ යුතුයි.

ඇම්. ජේ. ඇෆ්ජ්. ආර්. සේනාරත්න,
වාරිමාර්ග ඉංජිනේරුතැන.

හුලංදූ ඔය ව්‍යාපාරය,
ඇඹිලිපිටිය.
17. 11. 58,

---

වවුනියා උතුරු කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරි කර්මාන්ත ඉංජිනේරු තුමා විසින් මන්නාරම් උප කොට්ඨාශයට අයිති සිරාට්ටි කුලම් වැව අලුත්වැඩියා කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 70,000 කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ගෙන් ටැන්ඩර් පත්‍ර 30.12.58 දින දක්වා භාරගනු ලැබේ.

වැඩි විස්තර සඳහා මන්නාරම් උප කොට්ඨාශය භාර ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

ඒ. වෙල්ලප්පා,
වාරි මාර්ග ඉංජිනේරුතැන,
මන්නාරම් උප කොට්ඨාශය.

මුරුංකන්, 12.11.58.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැන විසින් 1958 දෙසැම්බර් 19 වැනි දින ෆෙරවරු 9.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසැලේ නම | | වැඩ විස්තර |
|---|---|---|
| බදි/ඇල්ලකෝන විද්‍යාලය | ... | ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම. |
| බදි/නියදගල විද්‍යාලය | ... | ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ කිරීම. |

සංලක්‍ෂ්‍යය.—බදි= බදුලු දිස්ත්‍රික්කය.

2. අංක 1 සිට 2 සඳහා රු. 5,000 ඉහල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1 සිට 2 සඳහා රු. 10,000 ඉහළ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා ලියා පදිංචි වී සිටින අයට කොළඹ අධ්‍යාපන අධ්‍යක්‍ෂ තුමාගේ කාර්‍යාලයේ ඒ. සී. ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය සඳහා රු. 100 තැන්පත් කළ කුවිතාන්සියක් බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කිරීමෙන් 1958. 12. 18 දින පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. චැක්පත්. මනි ඕඩර්, පෝස්ටර් ඕඩර් භාරගනු නො ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි, කොළඹ, අධ්‍යාපන අධ්‍යක්‍ෂක තුමාගේ කාර්‍යාලයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැක. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවන ඡෙදයේ සඳහන් පරිදි ලියාපදිංචි වී සිටින බව ඔප්පු කළ හැකි අයට පමණි.

4. ඉහත සඳහන් පරිදි පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියලුම වැඩි විස්තර බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්‍යාලයට ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතුයි. දේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපැලෙන් එවීමට අකමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සීල් තබන ලද ටෙන්ඩර් බණ්ඩාරවෙල අධ්‍යාපන සහකාර තැනට භාර දී, එසේ භාර ගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබා ගත යුතුයි. මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුලත් කවරය මත ටෙන්ඩර්කරුවාගේ නම සහ ලිපිනයත් වැඩයෙහි විස්තරත් සඳහන් කළ යුතුයි.

5. බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්‍යාලයේදී 1958.12.19 දින පෙරවරු 9.30ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා, ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරණු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ, සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂකවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සැම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීමට කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරණු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

එච්. ඒ. වී. සොයිසා,
වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරිතැන.

අධ්‍යාපන කාර්‍යාලය,
කුරුණෑගල, 21.11.58.

---

## ලුණු දෙපාර්තමේන්තුව

මන්නාරමේ ලේවායේ සිට මන්නාරමේ දුම්රිය ස්ථානයට ලොරිවලින් ලුණු ගෙනයෑම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤ වීදියේ ජේනරල්ස් ලේක් පාරේ නො. 110, තැ. පෙ. නො. 539 දරණ ලුණු කොමසාරිස් තැන විසින් 1958 දෙසැම්බර් මස 19 වැනි සිකුරාද පස්වරු 3 වනතුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්‍යාලයෙන් හෝ මන්නාරමේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් හෝ මන්නාරමේ ලුණු ලේවාය භාරකාර නිලධාරි තැනගෙන් ලබාගන්නා ලද ෆෝර්ම කොළවලය.

ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50 ක් ඕනෑම කච්චේරියක බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස් තැන.

අංකය : ටී. ජී. 209,
1958 නොවැම්බර් 28 වැනි දින,
කොළඹ.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ප්‍රවාහණ ජනසතු සේවා හා මාර්ග පිළිබඳ අමාත්‍යංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1958 දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා, කොළඹ වරාය කොමිෂන් සභාවේ මාස්ටර් ඇටෙන්ඩන්ට් තැනගේ බෝට්ටු මඩුවට සතියට තුන්වරක්, වරකට රාත්තල් 120 බැගින් අවුරුද්දක් තුළ මාළු සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1958 දෙසැම්බර් මස 17 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්‍යාලයේ දී පරීක්ෂාකළ හැක. රු. 100 ක මුදලක් වරාය කොමිෂන් කාර්‍යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1958 දෙසැම්බර් මස 16 වෙනි අඟහරුවාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇප කරුවන් අවශ්‍යවී නම් එය සැපයීමට ටෙන්ඩර්කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60 ක් සැම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඩී. ජී. දයාරත්න,
වරායේ කොමසාරිස්.

1958 නොවැම්බර් මස 19 වෙනි දින
කොළඹ වරාය කොමිෂන් සභා
කාර්‍යාලයේ දිය.

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### සේවයට අයෝග්‍ය මෝටර් බයිසිකල්, හිස් ටින් සහ පීප්ප මිලට ගැනීම

සේවයට අයෝග්‍ය මෝටර් බයිසිකල්, හිස් ටින් සහ පීප්ප මිලට ගැනීම සඳහා 1958 දෙසැම්බර් මස 19 වෙනි දින පෙරවරු 9.30 දක්වා කොළඹ ප්‍රධාන තැපැල් කාර්‍යාලයේ සහකාර පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් ටැන්ඩර් කැඳවනු ලැබේ.

වැඩි විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවන ඡේදයේ දැන්වීම් (ඉංග්‍රීසි) බලන්න.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්,

ප්‍රධාන තැපැල් කාර්‍යාලය,
කොළඹ, 1958. 11. 24

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම—වවුනියාව ගුදම

වර්ෂ 1959 ජනවාරි 1 වැනි දින පටන් අවුරුද්දක කාලසීමාවක් තුල වවුනියාවේ පිහිටි සුරාබදු ගුදමත් දුම්රිය බඩු ගබඩාවත් අතර, අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම පිණිස, සීල් තබන ලද ටැන්ඩර්, 1958 දෙසැම්බර් 10 වැනි දින දවල් 12 දක්වා උතුරු කොට්ඨාශය භාර යාපනේ සහකාර සුරාබදු කොමසාරිස් තැන විසින් භාර ගනු ලැබේ.

2. මේ සඳහා රුපියල් 10ක් කච්චේරියේ තැන්පත් කොට ලබාගත් රිසිට් පතක්, එකී සහකාර සුරාබදු කොමසාරිස් තැන වෙත ඉදිරිපත් කිරීමෙන් ලබාගත් ෆෝර්ම කොළවල, ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. මේ කාරණය සම්බන්ධව අවශ්‍ය තවත් විස්තර එකී සහකාර සුරාබදු කොමසාරිස් තැනගෙන් ලබා ගත යුතුය.

ටී. බී. වඩුගොඩපිටිය,
වැඩබලන සුරාබදු කොමසාරිස් තැන.

1958 නොවැම්බර් මස 22 වැනි දින,
සුරාබදු කොමසාරිස් තැනගේ කාර්‍යාලය,
කොළඹ.

---

## මහනුවර කච්චේරිය

මහනුවර මාවිල්මඩ පිහිටා ඇති උණ බම්බු කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා 1958.12.15 වැනි සඳුදා පෙරවරු 9.30 දක්වා මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. වැඩි විස්තර මහනුවර කච්චේරියේ ග්‍රාම සංවර්ධන අංශයෙන් ලබාගත හැක.

ඒ. ඇස්. ඩී. ද සිල්වා,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙනුවට.

1958.11.17,
මහනුවර කච්චේරියේ දිය.

---

කොළඹ කටුගෙයි අළුත් අතිරේක ගොඩනැගිලි සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958 දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයෙහි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්‍යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 385,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු 250 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 24.11.58.

---

කොම්පඤ්ඤ වීදියේ කණිෂ්ඨ පාඨශාලාව ගරාජයක් සහ නාප්පයක් බැඳීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 7,500 නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාතීමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවටය.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාතීමේන්තුවේ
කාර්යාලයේදීය. 24.11.58.

---

කඳාන හෘදයාභාද රෝහලේ අළුත් මුළුතැන්ගෙය සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයෙහි උතුරු කොළඹ ආ. වැ. දෙපාතීමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් රෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 115,000 නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 24.11.58.

---

විදුලි දෙපාර්තමේන්තුව ලිඳුල සුළු සේවක නිවාස සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. දිඹුල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 31,000 නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවටය.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 24.11.58.

---

මඩකලපු කච්චේරියේ වහලය අළුත් කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මඩකලපුවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,000 නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවටය.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 24.11.58.

---

මැදවච්චිය රෝහලේ මේට්‍රන් නිවාසයක් හා හෙදි නිවාස හතරක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 55,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට

පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මෙම සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කායඝාලයේදීය. 24.11.58.

---

වත්තරමුල්ලෙයි මධ්‍යම පාඨශාලාවේ ජනේලවලට යකඩ පොලු සවිකිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මඩකලපුව ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000 නොඅඩු ගනණකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කායඝාලයේදීය. 24.11.58.

---

වත්තරමුල්ලෙයි මධ්‍යම පාඨශාලාවේ ශිෂ්‍යාවන්ගේ නිවාසය පිටිපස තාප්පය බැඳීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මඩකලපුව ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000 නොඅඩු ගනණකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කායඝාලයේදීය. 24.11.58.

# බඩු බාහිරාදිය විකිණීම

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

පහත සඳහන් උපකරණ 1958 දෙසැම්බර් මස 6 වෙනිදා උදේ 9.30 සිට ටොරිංටන් චතුරශ්‍රයේ සෞඛ්‍ය ඉංජිනේරු කායඝාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය පැවැත්වෙන දිනයේ උදේ 8.30 සිට මේ උපකරණයන් පරීක්ෂා කිරීමට පුළුවන.

ඉල්ලුම්කරුවන් විසින් තමන් ඉල්ලුම් කළ භාණ්ඩයන් වෙන්දේසිය අවසානවූ විගසම මුදල් ගෙවා ගෙන යා යුතුය.

| අංකය | ද්‍රව්‍ය | | ප්‍රමාණය |
|---|---|---|---|
| 13. | සීනු ඔර්ලෝසු | ... | 2 |
| 27. | බන්ටන් මසින් වරාන්සිටයක හම් වවැසුම් | ... | 1 |
| 157. | කැමරා බහාලන හම් කොපු | ... | 1 |
| 350. | මේසය මත තබන වායු සම් කරන | ... | 1 |
| 362. | සර්කිට් හම් බෑග් | ... | 1 |
| 528. | ඩයිනමෝව සහ කටවුට් 127 | ... | 1 |
| 534. | 3″ රේ ජියර් පොම්ප මැග්නටෝ | ... | 2 |
| 671. | රබර් පට්ටම් 600 × 16 | ... | 2 |
| 672. | රබර් ටියුබ් 600 × 16 | ... | 2 |
| 795. | වෝල්ට්ස් 12v. එක්සයිඩ් බැටරි | ... | 2 |
| 912. | වෝල්ට්ස් 6v. බැටරි | ... | 1 |
| 922. | ධාවන වේගමානක | ... | 1 |
| 924. | වැකුම් යුනිට් | ... | 1 |
| 925. | බෝල ජොයින්ට් | ... | 1 |
| 927. | ඩයිනමෝ ආමේචර් | ... | 1 |
| 956. | රබර් පට්ටම් 600 × 15-6 | ... | 1 |
| 957. | රබර් ටියුබ් | ... | 2 |
| 960. | ස්පාටර් වායු නලා ජෝඩු | ... | 1 |
| 991. | නො. 12279 දරන රේපියර් ෆොම්පයට මැග්නටෝ | ... | 2 |
| 51. | වුල්fජ් විදුලි බුරුම ආමේචර් | ... | 1 |
| 52. | වුල්fජ් විදුලි බුරුම ස්විච් | ... | 1 |
| 237. | රබර් පට්ටම් 750 × 20-10 | ... | 6 |
| 238. | රබර් ටියුබ්ස් 750 × 20-10 | ... | 6 |
| 252. | සයිකල් fප්‍රීවීලය | ... | 1 |
| 301. | බෝල් රේසර් ඇක්සල් | ... | 1 |
| 302. | ස්ලීව් ඇක්සල් | ... | 1 |
| 332. | ස්ටියරිං බෝල් ජොයින්ට් | ... | 6 |
| 333. | හෙඩ් ලයිට්ස් රිfප්ලැක්ටර් | ... | 2 |
| 337. | කුඩා වරfපිකේටර් ජෝඩු | ... | 1 |
| 354. | පස්සා රෝදයේ බ්රේක් සිලින්ඩර් වොශර් රිfප්ලේස් මන්ට් කිට් | ... | 2 |
| 355. | ඉස්සරහ රෝදයේ බ්රේක් සිලින්ඩර් වොශර් රිfප්ලේස්මන්ට් කිට් | ... | 2 |
| 356. | රේයාර් ඇක්සල් ඔයිල් සීල් | ... | 2 |
| 367. | ආමේචර් රේසර් | ... | 1 |
| 368. | ආමේචර් බ්‍රශ් | ... | 1 |
| 370. | ට්‍රම්පට් නලා ජෝඩු | ... | 1 |
| 383. | සම්පූර්ණ දොර යතුරු තහඩු | ... | 1 |
| 448. | කාබරේටර් වැල්ව් | ... | 1 |
| 449. | කාබරේටර් වැල්ව් සීට් | ... | 1 |

ඊ. බී. ඇන්කිටල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

තැ. පෙ. අංක : 1434,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7.
25.11.1958.

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

Ax 3910

## 1958 වර්ෂයේ තොටුපල් රේන්ද විකිණීම

### කොළඹ දිස්ත්‍රික්කය

කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් 1959 ජනවාරි 1 වැනි දින සිට 1959 දෙසැම්බර් 31 වැනි දින කාල සීමාව තුළදී පහත පෙනෙන තොටුපලේ රේන්ද පවත්වාගෙන යෑම පිණිස ටෙන්ඩර් 1958 දෙසැම්බර් 8 වැනි දින පෙරවරු 11 දක්වා කොළඹ කච්චේරියේ දී භාරගනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

(1) දිග් ගල තොටුපල් රේන්දය.

2. සෑම ටෙන්ඩරයක්ම සීල් තබන ලද කවරයක බහා, කවරය පිටත වම් පැත්තේ ඉහළ කෙළවරේ "1959 වර්ෂයේ දිග් ගල තොටුපල් රේන්ද පිළිබඳ ටෙන්ඩරය" යනුවෙන් පැහැදිලිව සටහන් කර නොවැම්බර් 22 වැනි දින පෙරවරු 11ට ප්‍රථම කොළඹ, කච්චේරියේ දිසාපතිතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. මෙදින නියමිත වේලාවෙන් පසු කිසියම් ටෙන්ඩරයක් භාරගනු නොලැබේ. කච්චේරියේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් විය යුතුයි.

3. කිසියම් ටෙන්ඩරයක් පිළිගත් බව දැනුම්දුන් විගස ඒ අයිතිකරු විකිණීමේ කොන්දේසි පත්‍රය අත්සන් තබා, ඇප වශයෙන් ටෙන්ඩරයේ වටිනාකමෙන් තුනෙන් එක් කොටසක් මුදලින් කච්චේරියේ තැන්පත් කළ යුතුය.

4. රුපියල් පනහ (රු. 50) ක් මෙම කච්චේරියේ තැන්පත් කිරීමෙන් ලත් කුවිතාන්සියක් සමගම සෑම ටෙන්ඩරයක්ම එවිය යුතුය. පිළිගත් ටෙන්ඩර්කරුවාට කොන්දේසි පත්‍රය අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල් තැන්පත් කිරීමට හෝ ඒ අවස්ථාවේදී නොහැකි වුවහොත්, ටෙන්ඩරය සඳහා තැන්පත් කළ ඇප මුදල රාජසන්තක කරනවා පමණක් නොව, මතුවට ඔහුට රජයේ කිසිම කොන්ත්‍රාත්තුවක් ලබාගැනීමට ඉඩ නොසැලසෙනවා ඇත. පිළිගත් ටෙන්ඩර්කරු විකිණීමේ කොන්දේසි පත්‍රය අත්සන් කර නියමිත ඇප මුදල් තැන්පත් කළ පසු අනිකුත් ටෙන්ඩර් ඇප මුදල් ආපසු දෙනු ලැබේ.

5. ටෙන්ඩර් පිළිබඳ සියලුම අයිතිවාසිකම් හා අවසාන තීරණ දිසාපතිතුමා සතුය.

6. මේ පිළිබඳ වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් විමසන්න.

ජී. පී. තම්බයියා,
දිසාපති.

1958 නොවැම්බර් 24 වැනි දින,
කච්චේරිය, කොළඹ.

---

## ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පාලම් පාරු රේන්ද

1958 වේ දෙසැම්බර මස 19 වැනි දින පෙරවරු 9.30 දක්වා කින්නියයි, ගංගෙයි, මුතූර්, කිලිවෙඩ්ඩි, කඩ්ඩෛපරිච්චාන්, උප්පාර්, සලපෙ ආරු, ඉඩ්මන්තුරෛ, පුඩවෛකාඩු, යාන්ඔය හා ඉරක්කකණ්ඩි පාලම් පාරු රේන්ද විකිණීම සඳහා ටැන්ඩර පත්‍ර ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් ලාංකිකයින්ගෙන් පමණක් භාර ගනු ලැබේ.

2. ටැන්ඩර පෝරම 1958වේ දෙසැම්බර මස 18 වැනි දින දහවල් 12.00 දක්වා ලබාගතහැක.

අන්ටන් ආර්. මැක්හෙයිසර්,
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1958.11.17 වැනි දින,
ත්‍රිකුණාමල කච්චේරියේ දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී